# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2015 නොවැම්බර් මස 24 වන දින පෙ.ව.9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු එම්.රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/62)

අ) මිගමුව රෝහලේ දැනට පවතින රැකියා පුරප්පාඩු මොනවාද?

ආ) රෝහල් සේවක පුරප්පාඩු පිරවීම සඳහා ඔබතුමා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

ඇ) මෙම රෝහලේ සේවක පුරප්පාඩු පිරවීමට ප්‍රමාද වන්නේ නම් ඊට හේතු මොනවාද?

ඈ) මෙම පුරප්පාඩු පුරවා අවසන් කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන කාල පරිච්ඡේදයක් තුළදීද?

ඉ) මෙම රෝහල තුළ පවතින පුරප්පාඩු සුදුස්සන්ගෙන් පිරවීම මෙම වසර අවසානයට පෙර කළ හැකිද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

**02.** ගරු එම්.රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/63)

අ) කටාන ප්‍රදේශිය ලේකම් කොට්ඨශයේ රද්දොළුගම නිවාස සංකිර්ණයේ රජයට අයත් භූමියක "නානායක්කාර" නැමැති තැනැත්තා සති පොළක් පවත්වාගෙනයමින් ආදායම් උපයන බව ඔබතුමා දන්නේද?

ආ) එකී සති පොළ පවත්වාගෙන යාම වෙනුවෙන් කිසිදු මුදලක් කටාන ප්‍රාදේශිය සභාවට හෝ කිසිදු රාජ්‍ය ආයතනයකට නොගෙවන බව ඔබතුමා දන්නේද?

ඇ) මෙසේ පසුගිය ආණ්ඩු සමය තුල රජයේ දේපල උපයෝගි කර ගනිමින් සතිපොළ පවත්වාගෙනයමින් උපයන ලද ආදායමින් රජයට ගෙවිය යුතු මුදල් අයකර ගැනිමට ඔබතුමා කටයුතු කරන්නේද?

ඈ) එසේම අයුතු ලෙස පවත්වාගෙන යන මෙම සති පොළ නැවැත්විමටත් අදාල රාජ්‍ය ආයතන මගින් නිසි ටෙන්ඩර් පටිපාටියක් යටතේ මෙම පොළ ඉදිරියට පවත්වාගෙන යාමටත් ඔබතුමා පියවර ගන්නේද?

ඉ) නොඑසේ නම් ඒ මන්ද?

**03.** ගරු එම්.රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/64)

අ) කටාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශිය සභා සීමාව තුල රජයේ මුදල් ලක්ෂ හැත්තෑවක් (රු 7,000,000/-) වියදම් කර වැලිහේනේ තැනු වෙළඳ සංකිර්ණයේ ආදායම් ලබන්නේ 'ජෙය රාජ් ප්‍රනාන්දුපුල්ලේ පදනම' බව ඔබතුමා දන්නේද?

ආ) එකී සාප්පු සංකිර්ණයේ කඩකාමර ටෙන්ඩර් පටිපාටියක් මත ලබාදී නොමැති බව ඔබතුමා දන්නේද?

ඇ) එකී සාප්පු සංකිර්ණයේ කඩකාමර ටෙන්ඩර් පටිපාටියක් අනුව ලබාදීමට ඔබතුමා පියවර ගන්නේද?

ඈ) එකී සාප්පු සංකිර්ණයෙන් 'ජෙය රාජ් ප්‍රනාන්දුපුල්ලේ පදනම' ලබාගන්නා ලද රජයට අයවිය යුතු ආදායම් අය කර ගැනිමට ඔබතුමා පියවර ගන්නේද?

ඉ) නොඑසේ නම් ඒ මන්ද?

**04.** **ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(ප්‍ර/VI (1) /15/65)

ඇ. I) 2011 සිට 2015 දක්වා එක් එක් වර්ෂයේ බස්නාහිර පළාත් සභාවට අයත් පාසල්වල 1-13, 1-11, 6-13, 6-11 හා 1-5 ශ්‍රේණි සහිත පාසල් සංඛ්‍යාව කොපමණද?

II) ඉහත පාසල් වල ශිෂ්‍ය සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව සහ පංති කාමර සංඛ්‍යාව ඉහත වර්ෂයන්ට අදාළව වෙන් වෙන්ව කොපමණද?

III) බස්නාහිර පළාතේ සියලුම පාසල්වල එක් එක් විෂය ධාරාව යටතේ උසස් පෙළ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

IV) අළුතින් උසස් පෙළ විද්‍යා විෂය ධාරාව ආරම්භ කළ පාසල්හි එම විෂය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඊට යොදවා ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද?

ආ. I) ද්විතියික පාසල් සංවර්ධන ව්‍යාපෘතියට අයත් පාසල් ලැයිස්තුව සඳහන් කර ඊට අදාළව මේ වන විට සංවර්ධනය කළ පාසල් සංඛ්‍යාව හා නාම ලේඛණය ඉදිරිපත් කරන්නේද?

II) බස්නාහිර පළාතේ ක්‍රියාත්මක ද්විතීයික පාසල් ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කර තිබේද?

III) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු ද්විතියික අංශයේ ඉගෙනුම ලබන සිසුන් පාසල් අධ්‍යාපනයෙන් ගිලිහීයාම වාර්ෂිකව අඩු වී තිබේද?

IV) එම සංඛ්‍යා දත්ත මේ සභාවට ඉදිරිපත් කරන්නේද?

V) ඒ අනුව ජනප්‍රිය පාසල් වලට ඇති ඉල්ලුම 2016 වර්ෂය වනවිට අඩු වී තබේද?

VI) ඒ කොපමණ සංඛ්‍යාවක්ද?

**05.** **ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(ප්‍ර/VI (1) /15/66)

ඇ. I) මිනුවන්ගොඩ කලාපයට අයත් මිරිගම බණ්ඩාරනායක මහා විද්‍යාලයේ (අනුබද්ධය) විදුහල්පති ස්වාමින් වහන්සේ මැයි මාසයේ මැද භාගයේ සිට ස්ථාන මාරු කර ඇති බව ඔබතුමා දන්නවාද?

II) උන්වහන්සේ ස්ථාන මාරු කරන විට ඒ වෙනුවට වෙනත් විදුහල්පතිවරයෙකු ලබාදි නොමැති බව ඔබතුමා දන්නේද?

III) අනුප්‍රාප්තිකයෙකු රහිතව ගුරුවරයෙකු මෙන්ම විදුහල්පතිවරයෙකු ස්ථාන මාරු කිරීම ක්‍රම විරෝධී බව පිළිගන්නේද?

ආ. I) ස්ථිර විදුහල්පතිවරයෙකු නොමැති බැවින් මෙම පාසලේ පරිපාලනය හා විනය යම් තරමකින් බිඳවැටී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

II) මෙම විද්‍යාලයට සුදුසුකම් සහිත ස්ථිර විදුහල්පතිවරයෙකු ලබාදීමට කටයුතු කරන්නේද?

III) එසේ නම් ඒ කවදා සිටද?

**06. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(පු/VI (1) /15/67)

අ. I) කොළඹ අධ්‍යාපන කලාපයේ විධිමත්ව ගුරුවරුන් මාරු කිරීම සඳහා ජාතික ගුරුමාරු ප්‍රතිපත්තිය අනුව ගුරු මාරු මණ්ඩලයක් පත්කර ඇති බව ඔබතුමා දන්නේද?

II) එසේ තිබියදී කොළඹ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ගුරු මාරු මණ්ඩලයේ අනුමැතියකින් හා එකඟතාවයකින් තොරව අවුරුද්ද පුරාම විටින් විට ගුරුවරු මාරු කරන බව ඔබතුමා දන්නේද?

ආ. I) කොළඹ කලාප අධ්‍යක්ෂ විසින් තමන්ට අවශ්‍ය පරිදි 2015-10-19 දින සහ ආසන්න වෙනත් දිනයක කොළඹ මහාබෝධි විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ ගුරුවරියක් කොළඹ ශාන්ත ජෝන් විද්‍යාලයයට මාරු කර ඇති බව සහ කොටහේන මෙතෝදිස්ත විද්‍යාලයේ එවැනි මාරුවීමක් සිදුකර ඇති බව ඔබතුමා දන්නේද?

II) කොළඹ කලාපය තුළ දිගින් දිගටම සිදුවන මෙවැනි අවිධිමත් ගුරු මාරු කිරීම් නතර කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

III) නොඑසේනම් ඒ මන්ද?

**07. ගරු කේ.ඩී. අරුණ දිපාල් මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(පු/VI (1) /15/68)

අ) 2016 වර්ෂයට අදාළ අය වැය යෝජනා සකස් කිරීමේදී ගරු පළාත් සභා මන්ත්‍රී සහන් ප්‍රදීප් මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලද පරිදි ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා විෂය පුහුණුව සඳහා ඩිප්ලෝමා හෝ උසස් ගණයේ පාඨමාලාවන් හැදෑරීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර ඇත්තේද?

ආ) එසේ නම් කුමන ආයතනයක, අදාල පාඨමාලාව හැදෑරීමටද?

ඇ) එක් අයෙකුට වන වියදම කොපමණද?

ඈ) වර්ෂයකට කොපමණ මන්ත්‍රීවරු සංඛ්‍යාවකට අවස්ථාව ලබා දීමට අදහස් කරන්නේද?

ඉ) පාඨමාලාවේ කාලසීමාව පිළිබඳ තොරතුරු ලබා ගෙන ඇත්ද? එසේ නම් කොපමණ කාලයක්ද?

ඊ) එම අවස්ථාව මෙම සභාව පළමු වරට නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට පළමුව ලබා දීම සුදුසු බව ඔබතුමා විශ්වාස කරන්නේද?

**08.** **ගරු රපිත රංගන හපුආරච්චිගේ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිලිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(පු/VI (1) /15/69)

අ) 2015 වර්ෂය සඳහා යෞවන කටයුතු වෙනුවෙන් කොපමණ මුදලක් වෙන් කර තිබේද?

ආ) බස්නාහිර පළාත් සභාව තුළ යෞවන කටයුතු ඉටු කිරීම වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් නිලධාරීන් කොපමණ ප්‍රමාණයක් සිටීද?

ඇ) මුදල් වෙන්කර නොමැතිනම් හෝ යෞවන කටයුතු වෙනුවෙන් නිලධාරීන් පත්කර නොමැති නම් හෝ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට යෞවන කටයුතු ගැසට් කර තිබීමෙන් බස්නාහිර පළාතේ ජනතාව වෙත ඇති වන සේවය කුමක්ද?

ඈ) යෞවන කටයුතු පිළබඳ අමාත්‍යාංශයේ කාර්ය භාරය කුමක්ද?

ඉ) ඉදිරි වසර සඳහා යෞවන කටයුතු වෙනුවෙන් ඔබතුමාගේ යෝජනා මොනවාද?

**09.** **ගරු මංජු ශ්‍රී අරංගල - විපක්‍ෂනායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා කුම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:**

(පු/VI (1) /15/70)

අ) හෝමාගම ප්‍රාදේශීය සභාවට අයත් සතිපොළ ටෙන්ඩර් කැඳවා පෞද්ගලික අංශයට භාරදීමට අදහස් කරන්නේද?

ආ) මෑතකදී විවෘත කරන ලද එම සතිපොළේ හෝමාගම ප්‍රාදේශීය සභාව මගින් අලුතින් කඩ කාමර ඉදිකිරීමේ සැලැස්මක් තිබේද?

ඇ) තිබේනම් ඒ කුමන අරමුණක් සඳහාද?

ඈ) හෝමාගම පොදු වෙළද සංකීර්ණය පිටුපස ඇති හිස් බිම් තීරුව මුදල් අයකර වාහන නවතා තැබීමේ අංගනයක් ලෙස ටෙන්ඩර් කැඳවා තීබේද?

ඉ) පොදු වෙළද සංකීර්ණය ඉදිරිපස ඇති හිස් බිම් කොටස පිලිබඳ යම් පියවරක් ගන්නේද? එසේ නම් ඒ කවරේද?

ඊ) වසර 15 ක් පමණ කාලයක සිට පොදු වෙළඳ සංකීර්ණය ඉදිරිපස කොටසේ පවත්වාගෙන යන ත්‍රීරෝද රථ, ලොරි රථ, හා වෙනත් වාහන නවතා තැබීම සඳහා වූ වාහන අංගනය පිලිබඳව යම් පියවරක් ගන්නේද?

උ) මෙම ස්ථානයේ වාහන නැවතුම් අංගනයක් ඇතිකිරීමෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ , කාන්තා කාර්යාංශයේ ලියාපදිංචි කාන්තා සංවිධාන වල නිෂ්පාදන අලෙවිය සඳහා ලබාදී ඇති වෙළඳ කුටි සඳහා ඉඩකඩ අහිමිවී යන අතර ඒ පිලිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද ?

ඌ) ඒ අනුව පොදු වෙළඳ සංකීර්ණය ඉදිරිපස ඇති බිම් කොටස පිලිබඳව ගන්නා ක්‍රියාමාර්ග පැහැදිලි කරන්නේද?

10. කාර්ය පටිපාටි රීති අංක 31අ(1) හි විධිවිධාන අනුව පිළිතුරු දීමට කල්ගන්නාලද ප්‍රශ්නය;

- ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015. 11. 17 වන දින සභාව කල්තබන අවස්ථාවේ දී අසන ලද ප්‍රශ්ණය;

(ප්‍ර/VI (1) /15/ADG-01)

අ) කැස්බෑව නගර සභාවට අයත් මඩපාත ශෛලතලාරාම පාරේ, මිරිස්වත්ත දෙසට ඇති මාර්ගයේ කොටසක් හා අළුබෝගහවත්ත පාර පෙරමුසු කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම ගම නැගුම යටතේ රුපියල් 14,30636.45ක ඇස්තමේන්තුව අනුව සිදුකර ඇති බව දන්නේද?

ආ) එහි ගිවිසුම්ගත සමිතිය හෝ ආයතනය කවරේද?

ඇ) වැඩ අවසන් කල දිනය කවදාද?

ඈ) අක්‍රමිකතාවයක් සිදුවීම නිසා මෙතෙක් මුදල් ගෙවා නැති බව දන්නේද?

ඉ) මේ වන විට මුදල් ගෙවන ලෙස බලපෑම් තිබේද?

ඊ) පළාත් පාලන කොමසාරිස් ගන්නා පියවර කවරේද?

උ) නොඑසේ නම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

## IX. සභාවේ රැස්වීම් - I

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව:

'2015-11-03 දින එළඹුණු සභා සම්මුතීන්ට අනුකූලව අද දින විසිර යැමෙන් අනතුරුව මෙම පළාත් සභාව 2015 දෙසැම්බර් මස 15 වන දින පෙ.ව. 9.00ට රැස්විය යුතුය.'

### සභාවේ රැස්වීම් - II

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව:

'2016 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 50(5) හි සඳහන් කාල පරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදුනොවිය යුතුයි.'

## X. පොදු කටයුතු

01. ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා කුම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

*" 2016 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය "*

*(මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කිරීම)*

02. ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා කුම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

*" 2016 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය "*

*(විසර්ජන ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කිරීම)*

## XI .. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.11.17 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.